# *සමාජ ස්තරායනය හා පුද්ගල ගීත රුචිකත්වය පිළිබද සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින්.)*

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**පී.එස් විජේසූරිය** [1]
**සුධීර ජයවීර**[2]

**සංක්ෂේපය**

සමාජයෙහි ජීවත්වන පුද්ගලයින් විවිධ තරාතිරමේ අය වෙති. ඔවුහු විවිධ සමාජවලට අයත් වූවන් වෙති. වයස, ආගම, රක්ෂාව, ආදායම, සමේ පාට, ජාතිය, කුලය ආදිය අනුව මිනිසුන් විවිධ තල වලට බෙදී සිටිති. මිනිසුන් අතර පවත්නා අසමානතාවය ඉන් වටහා ගත හැකිය. මෙම අසමානතාවය ලොකයේ සෑම තැනකම දක්නට ලැබෙන්නකි. ඕනෑම සමාජයක් නිසි ලෙස ක්‍රියාත්මක වීමේදී එම සමාජයේ ජීවත්වන පුද්ගලයින්ට ඒ ඒ කාර්යභාරයන්ට හා තත්වයන්ට අනුව ක්‍රියා කිරීමට සිදුවේ. ආර්ථික හෝ දේශපාලනික වශයෙන් සමාජීය වෙනසක් දක්නට ලැබෙන්නේ එහෙයිනි. මෙකී අසමානතාවය හේතුවෙන් පුද්ගල සමාජ සංස්කෘතික වටිනාකම් පවා වෙනස් වීමට භාජනය වේ. පුද්ගලයින්ගේ රුචිකත්වයද ඒ අනුව වෙනස් වී ඇති බව බොහෝ විද්වතුන්ගේ මතය වේ. එකී රුචිකත්වයේ වෙනස් වීම සමාජ ස්තරායනය අනුව වෙනස් වී ඇති ආකාරය වර්තමාන ප්‍රබල සංස්කෘතිකාංගයක් බවට පත්ව ඇති ගීතය ඇසුරින් විමර්ෂණය කිරීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වෙයි. එහිදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ක්‍රම දෙක මත පිහිටි පර්යේෂණයක් වන අතර නිරීක්ෂණය නම් පර්යේෂණ විධික්‍රමය භාවිතා කරමින් ප්‍රශ්ණාවලි ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදි. ඒ සදහා ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින් ස්තරායන නියදිය ඔස්සේ අවශ්‍ය තොරතුරු රැස්කර ගන්නා ලදි. මෙම පර්යේෂණයේදී ලබා ගන්නා ලද දත්ත වලට අනුව අනාවරණය වූයේ සමාජ ස්තරායනය අනුව පුද්ගල ගීත රුචිකත්වයේ පැහැදිලි වෙනසක් දැකගත හැකි බවයි. එහිදී ඔවුන්ගේ ආර්ථික තත්වය, අධ්‍යාපන තත්වය, ස්ත්‍රී/පුරුෂ භාවය ආදී වූ කාරණාවන් ඔවුන්ගේ රුචිකත්වය වෙනස් වීමට බලපා ඇති බවත් එය ඔවුන්ගේ ගීත රුචිකත්වය වෙනස් වීමටද ප්‍රබල ලෙස බලපා ඇති බවත්ය.

**ප්‍රමුඛ පද: සමාජ ස්තරායනය, ගීතය, රුචිකත්වය.**

*1. සමාජ විද්‍යාව, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*